# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය

## ජපානයේ රැකියා අවස්ථා සඳහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් යොමු කිරීමේ වැඩසටහනට අදාලව අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම

විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ IM Japan ආයතනය (International Manpower Development Organization) සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව ජපානයේ රැකියා අවස්ථා සඳහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් යොමු කිරීමේ වැඩසටහන මේ වන විට ආරම්භ කර ඇත.

ඒ අනුව ප්‍රධාන වශයෙන් "සාත්තු සේවය" රැකියා කාණ්ඩය සඳහා රැකියා අවස්ථා පවතින අතර, රැකියා අපේක්ෂකයින් පහත මූලික සුදුසුකම් සපුරාලීම අනිවාර්යය වේ.

- ජපන් භාෂා ප්‍රවීණතාව JLPT 4 හෝ NAT 4 සමත් වීම හෝ ඊට ඉහල සුදුසුකම්.
- ශරීරයේ Tattoo නොතිබිය යුතුය.
- අයදුම් කිරීමේදී වයස අවු. 18 – 30 අතර විය යුතුය.
- අපොස උ/පෙළ විභාගය සඳහා පෙනී සිටි අය විය යුතුය.
- අවම උස - කාන්තා 150cm , පිරිමි 160cm හෝ ඊට වැඩි විය යුතුය.
- ජපානයේ ශිෂ්‍ය වීසා සඳහා අයදුම්කර නොතිබීම - ජපානයට TITP වැඩසටහන මගින් මීට පෙර ජපානයට නොගොස් සිටීම හා ජපානයේ නීතිවිරෝධීව රැඳී නොසිටීම.
- ඇස් පෙනීම 6 X 6 දක්වා.
- වර්ණ අන්ධ නොවීම.

ඉහත මූලික සුදුසුකම් සහිත රැකියා අපේක්ෂකයින් සඳහා සාත්තු සේවිකා (කාන්තා) රැකියා කාණ්ඩයේ රැකියා අවස්ථා මේ වන විටද කාර්යාංශය වෙත ලැබී ඇති අතර ඒ සඳහා මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපැල මඟින් කඩිනමින් යොමු කරන ලෙස දන්වා සිටිමු.

මීට අමතරව සාත්තු සේවක (පිරිමි) රැකියා කාණ්ඩය සඳහා ඉදිරියේදී රැකියා අවස්ථා ලැබීමට නියමිත බැවින් රැකියා අපේක්ෂකයින් කාර්යාංශයේ ලියාපදිංචි කරවා ගැනීම මේ වන විට ආරම්භ කර ඇත.

ඒ අනුව ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති රැකියා අපේකෂකයින් මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපැල මඟින් 2018.07.26 දිනට පෙර යොමු කරන ලෙස දන්වා සිටිමු.

අයදුම්පත් යොමු කල යුතු ලිපිනය,

| | | |
|---|---|---|
| ලියාපදිංචි තැපැල | : | කලමණාකරු<br>අලෙවිකරණ හා බඳවාගැනීම් (සාමාන්‍ය) අංශය<br>අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>කොස්වත්ත, බත්තරමුල්ල |
| විද්‍යුත් තැපැල | : | mgr_mkt@slbfe.lk |